www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බොරිස් යෙල්ට්සින්ගේ කටුක උරුමය (1931-2007)

## The bitter of Boris Yeltsin (1931-2007)

**විලැඩිමිර් වොල්කොෆ් විසිනි**
**2007 අප්‍රේල් 26**

පශ්චාත් සෝවියට් රුසියාවේ ප්‍රථම ජනාධිපති වූ බොරිස් යෙල්ට්සින් අප්‍රේල් 23 වැනි දා 76 හැවිරිදි වියේ දී මොස්කව් රෝහලක් තුල දී හෘදයාබාධයක් හේතුවෙන් මිය ගියේ ය. ඉතිහාසය තුල ඔහු ලෝක දේශපාලන අපරාධකරුවකු ලෙස සටහන් වනු ඇත.

කොමියුනිස්ට් පක්ෂයේ අවසාන ප්‍රධාන ලේකම්වරයා වූ මිකායිල් ගොර්බචොෆ් හා එකල සිටි ප්‍රධාන පෙලේ සෝවියට් නිලධාරියා සමග එක්ව යෙල්ට්සින් 20 වන සියවසේ විශාල තම ව්‍යසනයන්ගෙන් එකක් වන 1991 දී සෝවියට් සංගමය විසුරුවාලීමේ දී ප්‍රධාන භූමිකාවක් ඉටු කලේ ය.

මිරිකී ගිය දරිද්‍රතාවයෙන්, ප්‍රජාතන්ත්‍ර අයිතීන් අහිමි කරනු ලැබීමෙන් සහ සාපරාධී පාලක කල්ලියක ඇදහිය නො හැකි මට්ටමේ ධනවත් වීමේ නින්දාශීලී දසුනෙන් දශක දෙකක් තිස්සේ පෙලෙමින් සිටි පෙර සෝවියට් සංගමයේ ජනතාවට පමනක් නොව සමස්ත ලෝකයේ ම කම්කරු පන්තියට ද මෙම සිද්ධියෙන් ව්‍යසනකාරී ඵලවිපාක ගෙන දුන්නේ ය.

ලෝක දේශපාලන සිතියමින් සෝවියට් සංගමය මකා දැමීම ලෝක අධිරාජ්‍යවාදයේ සියල්ලටමත් වඩා එක්සත් ජනපදයේ මංකොල්ලකාරී අත් ලිහා දැමුවේ ය. එයින් මිලිටරිවාදය, නව විජිතවාදී ආක්‍රමනශීලීත්වය සහ ස්වභාවික සම්පත් පාලනයේ ලා ලෝක බලවතුන් අතර බිහිසුනු අරගල පුපුරා ඒමට මග සලසාලී ය. මෙම ක්‍රියාවලියේ නිරුවත් ම ප්‍රකාශවීම වූයේ, ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ - සාමාන්‍ය ජීවිතය මිහිපිට අපායකට සරිලනසේ පරිවර්තනය වූ රටවල- යුද්ධය සහ වාඩිලා ගැනීම් ය.

භූදේශපාලන ප්‍රචන්ඩත්වය උත්සන්නවීම බටහිර, මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ මෙන් ම ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ සහ ලෝක අධිරාජ්‍යවාදයේ මධ්‍යස්ථානය වන එක්සත් ජනපදයේ ජීවන තත්වයන්ට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහි අනුකම්පා විරහිත ප්‍රහාරයක් සමග අත්වැල් බැඳ ගෙන තිබේ. මෙම ප්‍රතිගාමී රැල්ල හා සමාන්තර දෙයක් ඉතිහාසයේ නො වින. මෙය ලෝක ජනතාවගෙන් බහුතරයට පෙර නො වූ විරූ ව්‍යසන ඇති කිරීමට තර්ජනය කරයි.

සෝවියට් සංගමය බිඳ වැටීම කිසිදු අයුරකින් ධනේශ්වර දෘෂ්ටිවාදීන් පෙරට දමන ඉදිරිදර්ශනය වන ඇමෙරිකාව ප්‍රතිවිරෝධයකින් තොරව ලෝකයේ කටයුතුවල ආධිපත්‍ය දරනු ඇතැයි යන "ඉතිහාසයේ අවසානයක්" නොඅඟවයි. ඊට පරිබාහිරව එමගින් පලමු ලෝක යුද්ධය මුවවිට පැවති අකාරයේ ආර්ථික සහ දේශපාලන ආතතීන්ගෙන් මෙහෙයවන අන්තරායකාරී ලෙස පුපුරන සුලු තත්වයක් නිර්මානය කර තිබේ.

20වන සිය වස මුල දී ලෝක ධනවාදී පද්ධතියේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතාවන් දශලක්ෂ ගනන් ජීවිත බිලි ගනිමින් දශක ගනනාවක් තිස්සේ ඇදී ගිය ජාත්‍යන්තර සබඳතාවල අර්බුදයකට ද කම්පන හා කැලඹීම් මාලාවකට ද මග සැලසීය.

සෝවියට් සංගමය බිහි වූ 1917 ඔක්තෝබරයේ රුසියානු විප්ලවය ධනවාදයේ ඓතිහාසික මලපුඩුවට තිබුනු පිලිතුර ය. කම්කරු පන්තියේ ජාත්‍යන්තර උවමනාවන් සහ සමාජ ප්‍රගතියේ ඉදිරිදර්ශන මූර්තිමත් කර ගත් සෝවියට් සංගමය, සමාජ සමානතාවයේ සහ ප්‍රජාතන්ත්‍රීය ආර්ථික සැලසුම්කරනයේ පදනම මත සමස්ත ලෝක පද්ධතිය ම නවීකරනය කිරීමේ පිනුම් පෙත ලෙස, බොල්ෂෙවික් පක්ෂයේ (ප්‍රධාන කොට ම ඉතාමත් ම වැදගත් ම නායකයින් වූ ලෙනින් හා ට්‍රොට්ස්කිගේ) නායකත්වය යටතේ පිහිටු වනු ලැබී ය.

කෙසේ වෙතත් රටේ ආර්ථික පසුගාමීත්වය සහ දේශපාලන හුදකලාව හේතු කොට ගෙන සෝවියට් රාජ්‍යය තුල වැඩුනු ස්ටැලින්වාදී නිලධරය විසින් මෙම සමාජවාදී ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනය පාවා දෙනු ලැබී ය. නිලධරය ජාත්‍යන්තර විප්ලවයේ මාවත ප්‍රතික්ෂේප කර 1920 ගනන් මැද වන විට 'තනි රටේ සමාජවාදය' නමැති ජාතික ප්‍රතිසංස්කරනවාදී න්‍යායට අනුගත වූ හ.

ඔවුහු ලෝක අධිරාජ්‍යවාදය සමග සහයෝගිවීමේ සහ ලොව පුරා විප්ලවවාදී ව්‍යාපාර මැඩලීමේ පිලිවෙතක් ඇරඹූහ.

බලයේ ලීවරයන් සිය අත්වල සංකේන්ද්‍රනය කර ගත් ස්ටැලින් යටතේ වූ නව පාලක නිලධර වංශාධිපතිත්වය සමාජවාදී බුද්ධිමතුන් හා දියුනු

කම්කරුවන් සමස්ත පරම්පරාවක් ම ශාරීරිකව මුලිනුපුටා දමමින් සහ රටේ ජීවමාන විප්ලවවාදී උරුමය මැඩලමින් 1930 ගනන් අවසන් භාගය වන විට 'අති විශාල භීෂනයක්' මුදා හැරියේ ය.

1930 ගනන් සිට 1980 ගනන් දක්වා සෝවියට් සංගමය කම්කරු රාජ්‍යයක් වූයේ 1917 විප්ලවය විසින් ඇති කරනු ලැබූ ජනසතු කරන ලද දේපල සබඳතාවලට හානියක් නොවීම දක්වා පමනකි. අන් සියලු ම අංශවලින් එය ධනේශ්වරය ඉදිරිපිට නමස්කාර කරන සහ සමාජවාදයේ ජීවය, පරමාදර්ශ හා විධික්‍රමවලට ගැඹුරින් ම වෛරී වූ වරප්‍රසාදිත නිලධරයක පාලනයකි.

යෙල්ට්සින් මෙම සමාජ වටපිටාවේ ඍජු ඵලයකි. ඔහුගේ යටහත්භාවය, ඔහුගේ දෘෂ්ටියේ සීමිත බව, විවේචනාත්මක චින්තනය කෙරෙහි උනන්දුවක් නැතිකම, ඔහුගේ විශාල අහංකාරය, මදාවිකාරකම සහ සාමාන්‍ය ජනයා කෙරේ වූ අවඥාව, ස්ටැලින්වාදය විසින් වගාදිගා කරන ලද සහ ධනවාදය පුනස්ථාපනය සඳහා නිශ්චිතව ම අවශ්‍ය වූ ගුනයන් ය.

යූරල් ප්‍රදේශයේ බුට්කා ගම්මානයේ ගොවි පවුලක උපත ලබා සිය පියා ගොඩනැගිලි කම්කරුවකු ලෙස සිටි පර්ම් වෙත සිය පවුල සමග ගිය යෙල්ට්සින් ජීවිතය ඇරඹුවේ සාපේක්ෂ දුගී තත්වයක ය. ගොඩනැගිලි ඉංජිනේරුවකු ලෙසින් වැඩ ඇරඹූ යෙල්ට්සින් වැටුප් ලබන නිලධාරියකු වෙමින් ස්වර්ඩ්ලොව්ස්කි (යෙක්ටරින්බර්ග)වල කොමියුනිස්ට් පක්ෂ මෙවලම කරා සිය මාවත සොයා ගත්තේ ය. 1976 වන විට ගොර්බචෝෆ් විසින් දේශපාලන කමිටුවට ගෙනැවිත් අනතුරුව මොස්කව් නගරයේ සීපීඑන්යූවේ ප්‍රථම ලේකම් බවට පත්කරන තුරු ඔහු සෙවර්ඩ්ලොව්ස්ක් පක්ෂ සංවිධානයේ ප්‍රථම ලේකම්ව සිටියේ ය.

වයස 30 දී පමන යෙල්ට්සින් ජ්‍යෙෂ්ඨ පක්ෂ නායකයකු සහ නිලධරයකු බවට පත්වූ මොහොතේ සිට පෙරොස්ත්‍රයිකාවේ උච්ච අවස්ථාවේදී සෝවියට් සංගමයේ මහජන නියෝජිතයන් විසින් තෝරා පත්කර ගත් තැන දක්වා ම යෙල්ට්සින් පක්ෂයේ පිලිවෙත අනුගමනය කලේ ය. ඒකාන්තයෙන් ම මොනවා නැතත් ඔහු බ්‍රෙශ්නෙෆ් පිලිබඳ ගුන ගායනයේ දී සහ සාර් පවුල වෙඩි තබා දැමුන ස්වර්ඩ්ලොව්ස්ක්වල ඉපැටවුස්කි මැදුර විනාශ කිරීමට අන දීමේ දී ඔහු අන් අයට වඩා උද්යෝගිමත් අයකු වීය.

රුසියානු ඉතිහාසඥ වාඩිම් රොගොවින් සිය 'විකල්පයක් තිබුනි ද' යන වෙලුම් හතක සෝවියට් ඉතිහාසය පිලිබඳ කෘති මාලාවේදී මෙම පරම්පරාව කීප පොලකදීම හොඳින් විස්තර කර තිබේ. යෙල්ට්සින් 1937 ස්ටැලින් විසින් බඳවා ගත්තවුන් මත මුලුමනින් ම මූලධර්ම විරහිත වීම තුලින් කැපී පෙනුන නිලධාරී ස්ථරයේ පසුගමන්කරුවන් අතරින් කෙනෙකි. ස්ටැලින් විසින් ඉහලට නැංවූවන් "නායකයා විසින් දෙනු ලබන ඕනෑ ම නියෝගයක් එහි යුක්ති යුක්ත බව, සදාචාරාත්මක බව හෝ එවැනි කිසිවක් නොවී ම විශේෂ සිතා බැලීමකින් තොරව ප්‍රශ්න කිරීමකින් තොරව පිලිගෙන කීකරු ලෙස ඉටු කිරීමට" සූදානම් ව සිටියේ ය. (කෝනෙට්ස් ඔස්නැෂේ නැකාලෝ. මොස්කව්, 2006. පිටු 368)

ඔවුන්ගේ අඩි පාරේ පැමිනි යෙල්ට්සින් අයත් වූ "අන්ත නරුම පරම්පරාව" සමන්විත වූයේ, "කිසිදු විලි ලැජ්ජාවක් නැතිව අන්තයට ම දූෂිත වූ අතර රටේ සදාචාරමය අත්තිවාරම තැනුන පරමාදර්ශයන් ගැන සැලකිල්ලක් නො දැක් වූ" මිනිසුන් ගෙනි. (වඩිම් රොගොවින් දේශනය. "ඉස්ටොකි ඉ පොස්ලඩස්ට්වියා ස්ටැලින්ස්කොගෝ බොල්ශෝගෝ ටෙරෝරා" - 1996)

"වයස 60 වන තුරු කොමියුනිස්ට්වාදින්ව සිට හිටි හැටියේ ලජ්ජා නැති කොමියුනිස්ට් විරෝධීන් බවට පත් වූ" ගොර්බචොෆ්, යෙල්ට්සින් සහ යකොෆ්ලෙෆ් වැනි මිනිසුන්ගේ "හදිසි ප්‍රතිභානය" විශ්වාස කිරීම රොගොවින් ප්‍රතික්ෂේප කලේ ය. (එම දේශනය)

මේ සියලු පුද්ගලයන් ධනවාදයේ හවුල්කරුවන් බවට පත් වූයේ ඔවුන් සිය වරප්‍රසාදිත ස්තරයේ විශ්වාසවන්ත සේවකයන් වීම සහ එම ස්තරයේ වෙනස් වන හැඟීම් හා මනෝගතීන් නිවැරදිව ග්‍රහනය කර ගෙන එහි ද්‍රව්‍යමය උවමනාවන් අනුකම්පා විරහිතව ආරක්ෂා කිරීම නිසාය. ගොර්බචොෆ් විසින් නායකත්වය දෙනු ලැබූ සෝවියට් සංගමය ධනේශ්වර පුනස්ථාපනය ට සූදානම් කිරීම ඔහුගේ පෞද්ගලික චේල පිරිමසා ගැනීමේ ක්‍රමයක් නො වේ. මෙය 1980 ගනන්වල දී අධිරාජ්‍යවාදය සමග එක්වීමේ හා සෝවියට් සමාජයේ සමාජ - ආර්ථික පදනම් විනාශ කිරීමේ දිසාවට නිශ්චිත පියවරක් තැබුවා වූ සෝවියට් නිලධරයේ ප්‍රධාන ස්තරවල ඒකමතික පිලිවෙත වීය.

මෙම ස්තරය ඇතුලත මතු වූ තියුනු මත භේද - 1991 අගෝස්තුවේ දී හා 1993 ගෙවෙද්දී සන්නද්ධ ගැටුම් ලෙස පුපුරා ගිය - තිබියේ වුව ද ඒවා උපායාත්මක ස්වභාවයේ ප්‍රශ්න සම්බන්ධ මතභේද විය. ඒවා සෝවියට් නිලධරයේ කෑදර අරමුනු ඉටු කර ගැනීමේ වඩාත්ම සුදුසු මාවත තීර්නය කර ගැනීම සමග බැඳී තිබුනි.

සෝවියට් නිලධරය විසින් වගා දිගා කර තිබුනු හැටි ස්වභාවයන් යෙල්ට්සින් 1990 ජූනියේ රුසියානු ජනාධිපති පුටුවේ ලැග්ග මොහොතේ සිට 1999 දෙසැම්බරයේ ඉල්ලා අස් වන තුරු සර්ව සම්පූර්න කරන ලද සමාජ දේශපාලන ප්‍රතිගාමිත්වයේ වීරයාගේ භූමිකාව රඟපෑමට ඔහුට උදව් විය.

ලොව පුරා පල කරන ලද ශෝක ප්‍රකාශ තුලින් ජන මාධ්‍ය විසින් ඔහු, 'ප්‍රජාතන්ත්‍රවාදියකු' ලෙස - රුසියාවේ හා පූර්ව-සෝවියට් සංගමයේ ජනරජවල ජනතාවට නිදහස ගෙනදුන් තැනැත්තා ලෙස - උත්කර්ශයට නැංවීමට ගන්නා ලද සියලු උත්සාහයන්වල යථාර්ථය සමග කිසිදු සම්බන්ධයක් නැත. පශ්චාත් සෝවියට් රුසියාවේ ඉතිහාසය තුල, සලකා බැලෙන සිද්ධිය කුමක් වුව ද, ඒ ඕනෑ ම සිද්ධියක් යෙල්ට්සින් සහ ඔහු වට කරගෙන සිටි කවයේ උදවිය - මේ සියලු දෙනා සෝවියට් කම්කරු ජනයාගේ උවමනාවන් කෙරෙහි වෛරී සහගතය - කරන ලද ක්‍රියාවල විනාශකාරී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය ප්‍රදර්ශනය කරයි.

යෙල්ට්සින් පරිපාලනයේ පලමු තීන්දුවලින් එකක් වූයේ 1990 ජූනියේ දී රාජ්‍ය ස්වාධීනත්වය ප්‍රකාශයට පත් කිරීම යි. මෙය සෝවියට් සංගමය බිඳී යාමේ පදනම බවට පත් විය. 1991 මුලදී රුසියානු ආන්ඩුව රටේ අනෙකුත් සමූහාන්ඩු ආන්ඩුවල නායකයන්ට ද එවැනි පියවර ගැනීමට කුපිත කරවමින් සෝවියට් සංගමයේ අයවැයට බදු ගෙවීම ප්‍රායෝගිකව අත් හිටුවී ය.

මෙම ගමන්මාවත රටේ සමූහාන්ඩු හා අනෙකුත් කලාපවල ජාතිකවාදී සහ බෙදුම්වාදී ප්‍රවනතාවල සහයෝගයෙන් ශක්තිමත් විය. "ඔබට ඇති තරම් ස්වාධීනත්වය ලබාගන්න" යන යෙල්ට්සින්ගේ සටන් පාඨය අගතීන්ගේ ව්‍යාකූලත්වය ට ආයාචනා කල අතර එය 1991 මාර්තු ජනමත විචාරනයේ දී ප්‍රකාශ වූ අයුරු සංගමය රැක ගැනීමට අවශ්‍ය සෝවියට් පුරවැසියන් බහුතරයගේ මනාපයට පරස්පරවිරෝධී වූවක් විය.

## අගෝස්තු කුමන්ත්‍රනය සහ යෙල්ට්සින්ගේ ආරෝහනය

එම වසරේම අගෝස්තුවේ දී මිලිටරියේ කොටස්වල සහ කේජීබීයේ සහාය ලද ස්ටැලින්වාදී නිලධරයේ කොටසක් සෝවියට් ජනාධිපති ගොර්බචොෆ්ට එරෙහිව අසාර්ථක කුමන්ත්‍රනයක් දියත් කල අතර එය යෙල්ට්සින්ට පූර්ව සෝවියට් සංගමයේ බලය ඩැහැ ගැනීමට තත්වය සැකැසූ සිදුවීමක් විය. හුදු පැය 61 ක් තුල කඩා වැටුනු ඊනියා අගෝස්තු කුමන්ත්‍රනය සෝවියට් කම්කරු පන්තියේ ස්වාධීන ගමනක අනතුර විවර කරමින් ගොර්බචොෆ් අතින් පාලනය ගිලිහී යන්නේ යැයි බියට පත් මෙහිම ධනපති පුනස්ථාපනයේ කෙරී ගෙන යන ක්‍රියාදාමයේ දී වාසි බෙදා ගැනීමේ උත්සුක වූ නිලධරයේ කොටසක උවමනාව පිලිබිඹු කලේ ය.

එවකට රුසියානු ෆෙඩරේෂනයේ අලුතින් තේරී පත් වූ ජනාධිපති වූ යෙල්ට්සින් යුද්ධ ටැංකියක් මත නැගැ ගෙන කුමන්ත්‍රනයට විරෝධය දක්වමින් සහ බටහිර පුරා ප්‍රසංශාව ලබා ගනිමින් මෙම සිද්ධිය සිය දේශපාලන බලය පුම්බා ගැනීමට භාවිතා කලේ ය. පහලින් පවතින බලගතු නිලධර විරෝධී ව්‍යාපාරය ගසා කමින් ඔහු ගොර්බචොෆ් නායකත්වයෙන් බලයේ ලීවර උදුරා ගැනීමට සූදානම් වූ අතර කොමියුනිස්ට් පක්ෂය තහනම් කරමින් ඔහුගේ ම වූ ප්‍රති- කුමන්ත්‍රනයක් දියත් කලේ ය. සිව් මසකට පසු "බෙලොවිස්කි එකඟතාවය"ට අත්සන් තැබීමට යෙල්ට්සින් යුක්රේන හා බයිලෝ රුසියානු ජනාධිපතිවරු සමග එක්වීමත් සමග සෝවියට් සංගමය විසිරුවා හැරින. සෝවියට් ජනයා සිය සමාජ ගැටලු සඳහා විසඳුමක් අපේක්ෂා කල නමුත් සෝවියට් සංගමය අහෝසි කිරීම දශලක්ෂ ගනනකට කාලකන්නි කම ගෙන ආ "කම්පන ප්‍රතිකාරය"ට මග පෑදුවේ ය. මෙය සෝවියට් නිලධරයේ අවසන් පාවා දීම විය. සෝවියට් සංගමය විසුරුවා ලීමේ තීරනය වත් ධනවාදය පුනස්ථාපනයේ වැඩ පිලිවෙල වත් ජනමත විචාරනයක දී හෝ රුසියානු පාර්ලිමේන්තුවේ ඡන්දයක දී හෝ විවාදයකට ලක් වූයේ වත් ප්‍රජාතන්ත්‍රිකව අනුමත වූයේ වත් නැත. ජනතාවට හොරෙන් ක්‍රියාවට දැමුවා වූ ද ලෝක අධිරාජ්‍යවාදයේ පිටුබලය ඇති ව වංචනිකව ඔවුන් මත පැටෙව්වා වූ ද මෙම තීන්දු ජනතාවගේ ජීවන තත්වයන් විනාශ කර, රටේ කර්මාන්ත පදනම කඩා වැටීමට මග පාදා, පශ්චාත් සෝවියට් යුගයේ ලක්ෂ ගනනකගේ ජීවිත විනාශයට ඇද දැමූ ගනන් නැති ජාතික ගැටුම් අවුලුවා ලීය.

1991 අගෝස්තු කුමන්ත්‍රනයට විරුද්ධව රුසියානු පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ආරක්ෂා කිරීමට යුද ටැංකියක සිට ගැනීමෙන් හුදු වසර දෙකකට සොච්චමකට පසුව යෙල්ට්සින් ව්‍යවස්ථාව යලි සකස් කිරීමේ සහ පාර්ලිමේන්තුව අහෝසි කිරීමේ ඔහුගේ ඒක පාර්ශවීය තීරනවලට තේරී පත් වූ නියෝජිතයන් ප්‍රතිරෝධය දැක් වූ විට එම ගොඩනැගිල්ලට ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීමට 1993 ඔක්තෝබරයේ දී නියෝග දුන්නේ ය. බොරිස් යෙල්ට්සින්ගේ " ප්‍රජාතන්ත්‍රීය" විධික්‍රමයන් එවැනි ය.

මෙම සිදුවීම් අවසානයේ ජනාධිපතිට ප්‍රයෝගිකව අසීමත බලය ලබාදෙමින් ද පාර්ලිමේන්තුව සැරසිල්ලක් පමනක් බවට පරිවර්තනය කල නව ව්‍යවස්ථාවක් බලෙන් පැටවී ය. මෙමගින් ජනාධිපති ආඥාවන්ගේ පදනම මත ඒ වන විටත් පාලනය ගෙන යමින් සිටි යෙල්ට්සින් සිය බලය නීත්‍යානුකූල කර ගත්තේ ය. 1990 ගනන් මැද දී පෞද්ගලීකරනය තොග ගනනේ ක්‍රියාවට දැමී ය. එම ක්‍රියාවේ දී කර්මාන්තයේ ඉතා ම ලාභදායී කොටස් ප්‍රයෝගකාරී ක්‍රමවේද මගින් ඔලිගාකියේ අත්වලට නිකම්ම වාගේ පවරා දෙනු ලැබී ය. එක් ගනන් බැලීමකට අනුව ආසන්නව ඩොලර් බිලියන 200ක් තරම් වටිනා රාජ්‍ය දේපල ඩොලර් බිලියන 7කට පුද්ගලයින් අතට පත් කර තිබේ.

රාජ්‍ය දේපල මෙසේ උදුරා ගැනීම රුසියානු ජනයා සිය නායකයන්ට වෛර කිරීමේ ප්‍රධාන උල්පත්වලින් එකක් ලෙස දිගට ම පවතී. සමාජ සම්පත් තොග ගනනේ සොරකම් කිරීම අති විශාල ජනකායකට විනාශය කැඳෙව්වේ ය.

විශ්‍රාම දීමනා සහ වැටුප් නොගෙවූ අතර නිවාස නැතිකම සහ බඩගින්න ඉහල ගියේ ය. 1990 ගනන් තුල දී රුසියාවේ දල දේශීය නිශ්පාදිතය (ද.දේ.නි.) සියයට 50 කින් පහල වැටුනි. සම්පූර්න සියයට 30ක් ජනයා දරිද්‍රතාවයේ ගිලුනි. මරන රේට්ටුව සියයට 50 කින් ඉහල නැගුනි. පිරිමින්ගේ ආයු කාලය වසර ගනනකින් අඩු විය.

මේ අතරවාරයේ, දශ ලක්ෂ ගනනක් කාලකන්නිභාවයට පත් කිරීම සමග අලුත් ම ෆෝබ්ස් වාර්තාවට අනුව යෙල්ට්සින් ආන්ඩුවට සහාය දෙන පාතාල කල්ලියක අත්වලට ධනය විශාල ලෙස මාරු කිරීම තුලින් රුසියන් ප්‍රකෝටිපතීන් 60 දෙනෙකු බිහිවී තිබේ. දහස් ගනන් වන අලුත් කෝටිපතියන් මෙයට අමතර උදවිය ය.

යෙල්ට්සින් රජය 1994 දෙසැම්බරයේ දී උතුරු කොකේසසයේ ජන රජයට විනාශය කැඳවමින් සහ නීතියක් නැති නිරුවත් ප්‍රචන්ඩත්වයේ වාතාවරනයක් නිර්මානය කරමින් පලමු චෙච්නියා යුද්ධය ඇරඹීය.

ඒ සමග ම රුසියාව තුල සාපරාධිත්වය හා වංචාව වැජඹෙන්නට පටන්ගති. 1996 යෙල්ට්සින් යලි පත් වීමේ ඡන්ද ව්‍යාපාරය සමයේ ඇති වූ එක් සෝලියක් මෙම වංචාවන්ගේ සංකේතය බවට පත් වීය. ඒ අවස්ථාවේ දී යෙල්ට්සින්ගේ පූර්ව මැතිවරන මූලස්ථානයේ ඉහල පෙලේ ක්‍රියාකාරීන් දෙදෙනෙකු ආන්ඩුවවේ ගොඩනැගිල්ලකින් පිටතට ගෙන යමින් සිටි ඩොලර් මිලියන 500ක මුදලක් සමග අල්ලා ගන්නා ලදී. තවත් ඒ හා සමාන සෝලියක් වනුයේ තෙවසරකට පසුව සිදු වූ ආන්ඩුවේ මූලික නිලධාරීන්ගේ ආරක්ෂාව යටතේ සහ බටහිර ව්‍යාපාරිකයන්ගේ සහයෝගය සහිතව රුසියන් ඔලිගාකියේ ආදායම් සඟවා තැබීමේ කලු සල්ලි නීත්‍යානුකූල කිරීමේ ව්‍යාපෘතියක කොටසක් ලෙස ඩොලර් මිලියන ගනනක් සඟවා තැබීමේ කරලියට පැමිනි කල මතු වූ "නිව් යෝර්ක් බැංකු" සිද්ධිය ය.

යෙල්ට්සින් පරිපාලනයේ අවසාන කාල පරිච්ඡේදය 1998 අගෝස්තු මූල්‍ය අර්බුදයෙන් ඉහවහා ගියේ ය. මසක් තුල දී අගය සියයට 70 කටත් වඩා පහල ගිය රූබලයේ කඩා වැටීම ජනතාවගේ ජීවන තත්වයන්ට වැදුනු පහරකි. දෙවන චෙචන් යුද්ධය දිගේලි කිරීම මේ හා එක්ව සිදුවිය. මෙයට සමාන්තරව මීට පෙර ප්‍රසිද්ධියක් නොතිබුන හිටපු කේජීබී නිලධාරියකු වන ව්ලැඩිමීර් පූටින් යෙල්ට්සින්ගෙන් පසු බලයට පත්වන්නා බවට ඔසවා තැබින.

ජනමාධ්‍යවල කියා පැම්වලට ප්‍රතිරූපීව පූටින් තේරීම යෙල්ට්සින් විසින් කරන ලද "මහා අත්වැරැද්ද" නො වේ. ඔහුගේ පත් කිරීම මුලුමනින්ම ධනවාදය පුනස්ථාපනයේ තර්කනය සමග එක් ව ගමන් කරයි. නව පාලන ප්‍රභුවට තමන් සොරකම් කර ගත් ධනය අහිමි කර ගැනීමට අවශ්‍ය නො වී ය. වෙලෙඳපොල ප්‍රතිසංස්කරනය දිගටම සිදුවෙද්දී රටේ සමාජ අසමානතාවයේ මට්ටම ගැඹුරු විය. මේ තුලින් "රාජ්‍යය ශක්තිමත් කිරීම"- එනම් මර්දනකාරී මෙවලම - සහ ප්‍රජාතන්ත්‍රීය පාලනයේ සැරසිලිකාරක ආයිත්තම් පවා තව දුරටත් පටු කිරීම අවශ්‍ය කරලීය.

යෙල්ට්සින් මෙම පියවර මුලුමනින් ම අනුමත කල අතර ක්‍රෙම්ලිනය විසින් සකසන ලද මෙම භූමිකාව පූටින් විසින් සම්පූර්න කලේ ය. පූටින්ගේ රුසියාව යෙල්ට්සින්ගේ රුසියාව නිෂේධනය කිරීමක් නොව එහි තාර්කික අඛන්ඩතාවය ය.

යෙල්ට්සින් විශ්‍රාම ගැනීමෙන් පසු පූටින් පරිපාලනය පිලිබඳව කිසි දා බරපතල විවේචනයක් නො කිරීම අහම්බයක් නො වේ. පූටින් මෙය කල ගුන ලෙස පලමු රුසියානු ජනාධිපතිගේ මරනය පිලිබඳව කරන ලද කෙටි ප්‍රකාශයේ යෙල්ට්සින් "රට සහ දශ ලක්ෂ තරුන රුසියානුවන්ගේ යහපත තකා" සියලු දේ කිරීමට වෛර දැරූ "උතුම් අභිලාෂ" සහිත මිනිසකු ලෙස විස්තර කලේ ය.

විශේෂයෙන් ම චෙචන් යුද්ධයේ රුධිර ගලනය මගින් බලයට පත් වූ සහ අධිකාරීන් හෝ යම් නිලධාරියකුගේ හැසිරීම් හෝ විවේචනය කරන ඕනෑ ම අයකු "අන්තවාදියකු" ලෙස වරදකරුවකු කරන නිලධාරීගත ඔලිගාකිගත පොලිස් රාජ්‍යයේ මුදුනා බවට පත් වූ අයකුගේ මුවින් කියැවෙන විට මෙම වචන කුහකත්වයේ උච්චතම තත්වයට පත් වේ.

සමාජය හා මහජන මතය පිලිබඳව සම්පූර්න අවඥාව ප්‍රකශයට පත් කරමින් පූටින්, යෙල්ට්සින්ට ස්තුති වන්නට "ලොවට නිදහස් විවෘත රටක් ලෙස නව ප්‍රජාතන්ත්‍රික රුසියාවක් උපත ලැබීය. ආන්ඩුව ඇත්තෙන් ම ජනතාවට අයිති වූ රාජ්‍යයකි" එහි ජනතාවට "සිය අදහස් නිදහසේ ප්‍රකාශයට පත් කිරීමේ අයිතිය ද රටේ නායකත්වය නිදහස් ලෙස පත් කර ගැනීමේ අයිතිය ද" තිබේ යැයි සඳහන් කලේ ය. ඔහු එසේ පැවසුවේ ආන්ඩුවට එරෙහිව මොස්කොවේ සහ පීටර්බර්ගයේ සාමකාමී ලෙස විරෝධතා දැක් වීමට තරම් ගරුසරු නැති වූ ජනයාට පූටින්ගේ කැරලි මර්දන පොලීසිය විසින් පොලුවලින් ගසා සිය ගනනක් අත්අඩංගුවට ගැනීමෙන් සතියක් පමනක් ගත වූ තැන දී ය.

සෝවියට් සංගමය කඩා වැටීම "20 වන සියවසේ විශාලතම භූ-දේශපාලන ව්‍යසනය" යැයි ඔහු ම පැවසූ තරමට අනුව පූටින්ගේ ප්‍රකශය තුල

දේශපාලන" ස්කිට්සොෆ්‍රීනියා (මායා රූප සිතේ මැවීම ආදිය සහිත මානසික විකෘති තත්වයක්) මාත්‍රාවක් තිබේ. මෑත පැවැත් වූ තවත් කථාවක පූටින් "ආන්ඩුවවත් ව්‍යාපාරිකයන්වත් මෙම බලාපොරොත්තු ඉටු නොකල ද" 1990 ගනන්වල දශ ලක්ෂ ගනන් ජනයාගේ ශ්‍රේෂ්ඨ බලාපොරොත්තුවලින් සංලක්ෂිත වී යැයි ප්‍රකාශ කලේ ය.

'*නෙසවිසිමියා ගැසටා*' පුවත්පතේ හිටපු ප්‍රධාන කර්තෘ වූ දැනට '*මොස්කව්ස්කි නොවොස්ති*' සතිපතා පුවත්පතේ ප්‍රධානියා වන විටලි ට්රෙටියකොෆ් යෙල්ට්සින්ගේ මිය යාම සම්බන්ධව වඩාත් පැහැදිලි නිරීක්ෂනයක් සහිත තක්සේරුවක් සැපයුවේ ය. ඔහු මෙසේ ලියයි: "ඔහුගේ ජනාධිපති ධුර කාලයෙන් වැඩි කොටසක දී යෙල්ට්සින් නිදා ගත්තේ ය, බිව්වේ ය, රෝගීව සිටියේ ය, විවේක ගත්තේ ය, ජනතාව ඉදිරියේ සිය මුහුන නොපෙන් වූ යේ ය, හුදෙක් මොකුත් ම කලේ නැත."

රටේ බහුතරයක් පුරවැසියන්ගේ ගර්හාවට ලක් වූ යෙල්ට්සින් රුසියාවේ පලමු ජනාධිපති ලෙස ඔහුගේ යහපත් කමක් නිසා නොව ඒ වෙනුවට ඔහුගේ මොට්ටකම, ප්‍රාථමිකකම, සහ දාමරිකයකු මෙන් බලයට තිබූ අසීමිත කෑදරකම... තුලින් දෙකඩ වන තරමට (රට) දූෂනයට ලක් කල අයෙකු ලෙස ඉතිහාස ගත වනු ඇත"යැයි ට්රෙටියකොෆ් තව දුරටත් ලිවීය. (මොස්කවුස්කි නොවොස්ති 2006 අංක 4-6 )

"ප්‍රජාතන්ත්‍රවාදියකු" සහ "ප්‍රතිසංස්කාරකයකු" ලෙස බටහිර ආන්ඩු, සංගත මාධ්‍ය සහ සිය ධන නිධානයන් පැටව් ගැස්සවීමට උදව් උපකාර ලද රුසියානු ප්‍රකෝටිපතීන් හා කෝටිපතීන් විසින් අඬහැර නැංවූ යෙල්ට්සින් අවසාන විග්‍රහයේ දී දශක හතකට ආසන්න ගමන් මගේ දී ස්ටැලින්වාදී පාවාදීම් හා අපරාධවලින් නිශ්පාදිත වන පිලිලය නියෝජනය කලේ ය.

නිසැකව ම මෙම අපරාධයන්ගෙන් විශාලතම එක වනුයේ ධනවාදය පුනස්ථාපනයෙන් දිගේලි කැරුන පෙර නොවූ විරූ ආර්ථික හා සමාජ ව්‍යසනකාරීත්වයට සහ බොරිස් යෙල්ට්සින්ගේ ඇත්ත සහයෝගී කඳවුර නිර්මානය වී තිබූ හිටපු නිලධරයේ සහ දාමරික ව්‍යාපාරිකයන්ගේ කල්ලියට මුහුන දීමටත් ඔවුන් පරාජය කිරීමටත් කම්කරු පන්තිය දේශපාලනිකව සූදානම් නොකර අතහැර දැමීම මගින් අව්‍යාජ මාක්ස්වාදය සහ සමාජවාදී විඥානය ක්‍රමානුකූලව මර්දනය කිරීම සහ විනාශ කිරීම ය.

© www.wsws.org